| | | |
|---|---|---|
| 5 | 21-25 | |
| 6 | 26-30 | |
| 7 | 31-40 | |
| 8 | 41-50 | |
| එකතුව | | |

| | | |
|---|---|---|
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

1. දේශපාලනය
   (1) සමාජ ජීවිතයෙහි සෑම තැන්හි ම දක්නට ලැබේ.
   (2) සැළකිලිමත් වන්නේ මරණින් මතු ජීවිතය පිළිබඳ ව ය.
   (3) නීතිය විසින් අනුමත කරන ලද කටයුතුවලට පමණක් සීමා වේ.
   (4) ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලට සීමා වේ.
   (5) මර්දනකාරී බලයෙන් පමණක් ප්‍රකාශයට පත් වේ. (......)

2. දේශපාලනය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය අරමුණු කරන්නේ
   (1) ප්‍රජා ජීවිතය සඳහා පුරවැසියන් පුහුණු කිරීමට ය.
   (2) දේශපාලන ආයතනවලට පුරවැසියන් හැඩගැන්වීමට ය.
   (3) දේශපාලනය ක්‍රමානුකූලව අවබෝධ කර ගැනීමට ය.
   (4) සමාජයේ ප්‍රතිමාන සහ ඇගයුම් පෝෂණය කිරීමට ය.
   (5) පුරවැසියන් යහ කල්ක්‍රියාවට යොමු කිරීමට ය. (......

[දෙවැනි පිටුව බලන්න

රාජ්‍ය ප්‍රතිපත්තිය

(1) ඕනෑම සමාජ ප්‍රශ්නයකට ආණ්ඩුව දක්වන ප්‍රතිචාර වේ.
(2) ආණ්ඩු ආයතනවලින් පමණක් ක්‍රියාවට නැංවේ.
(3) ඉහළ මට්ටමේ නිලබලකරුවන් විසින් සම්මත කරනු ලැබේ.
(4) දේශපාලන අධිකාරීන් විසින් තීරණය කරනු ලබන අරමුණක් සහිත ක්‍රියාදාමයකි.
(5) පරිපාලන නිලධාරීන් විසින් පමණක් ගනු ලබන සවිස්තර ක්‍රියාමාර්ග වේ.

ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය

(1) වර්තමාන ලෝකයේ පවතින එකම සහසන්ධීය ක්‍රමය වේ.
(2) බලය වෙන්කර දීමේ දී පළමුව පහළ ම මට්ටමට බලය පවරා දීම (subsidiarity) යන මූලධර්මය අනුගමනය කරයි.
(3) වෙනම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයකින් යුක්ත ය.
(4) කොමියුනවල ස්වායත්තතාව ප්‍රතික්ෂේප කිරීමට කැන්ටනවලට බලය දෙයි.
(5) මෑත කාලයේ දී දැඩිව මධ්‍යගත වී ඇත.

. ඒකීය රාජ්‍යය

(1) නිරතුරුවම විමධ්‍යගතකරණය ප්‍රවර්ධනය කරයි.
(2) විෂමජාතීය සමාජවලට වඩාත් යෝග්‍ය වේ.
(3) සුළුතර ජනවාර්ගික ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව සනාථ කරයි.
(4) අනභිබවනීය බලතල සහිත මධ්‍යම ආණ්ඩුවකින් සමන්විත වේ.
(5) ගෝලීයකරණයෙන් එල්ල වන බලපෑමෙන් නිදහස් ය.

. ශ්‍රී ලංකාව

(1) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය නොවන සාමාජිකයෙකුව සිටියේ ය.
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබුයේ 1948 දී ය.
(3) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙලට (UNDP) විශාල මුදල් ප්‍රමාණයකින් දායක වී ඇත.
(4) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය අනුමත කිරීම ප්‍රතික්ෂේප කළේ ය.
(5) නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය මූලාරම්භයේදී ම එහි සාමාජිකත්වය ලබාගැනීම ප්‍රතික්ෂේප කළේ ය.

7. අන්තර්ජාතික අන්තර්-රාජ්‍ය සංවිධාන

(1) සාමාජික රාජ්‍යවල සාමූහික අභිලාෂ නියෝජනය කරයි.
(2) බහුජාතික සමාගම්වල අභිලාෂ නියෝජනය කරයි.
(3) ගෝලීය සිවිල් සමාජයේ අභිලාෂ නියෝජනය කරයි.
(4) ආර්ථික ගෝලීයකරණය වළකාලයි.
(5) වෙළෙඳපොල බලවේගවල අභිලාෂ නියෝජනය කරයි.

8. කෝල්බෲක්-කැමරන් කොමිෂන් සභාව නිර්දේශ කළේ,

(1) කන්ද උඩරට රදළ තන්ත්‍රය අහෝසි කිරීමට ය.
(2) ශ්‍රී ලංකාවේ ද්විත්ව-පරිපාලන ක්‍රමය අඛණ්ඩව පවත්වා ගැනීමට ය.
(3) සාම්ප්‍රදායික සමාජ නිර්මිතය අඛණ්ඩව පවත්වා ගැනීමට ය.
(4) අධිකරණය සම්බන්ධ අධීක්ෂණ බලතල ආණ්ඩුකාරවරයාට පැවරීමට ය.
(5) ස්වදේශිකයන් අතර සමාජ සචලතාව ඇති වන පියවර ගැනීමට ය.

9. දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය

(1) මාක්ස්වාදී න්‍යායෙන් පමණක් ආභාසය ලබා ඇත.

(2) දේශපාලනය ආර්ථික සාධක සමග එකිනෙකට බැඳී ඇතැයි සලකයි.

(3) ලිබරල් ආර්ථික න්‍යායයේ බලපෑමෙන් නිදහස් ය.

(4) ආනුභවික සාක්ෂි මත පමණක් පදනම් ව ඇත.

(5) යටත් වැසියා කෙරෙහි ආධිපත්‍යය පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කරයි.

10. යටත් විජිත රාජ්‍යය

(1) විජිත කාරකයා සහ විජිත වැසියා අතර සම්බන්ධතාව විස්තර කරන සංකල්පයකි.

(2) විජිත වැසියාගේ අභිලාෂ නියෝජනය කරයි.

(3) යටත් විජිතයේ පවත්නා තත්ත්වය (*status quo*) එසේම පවත්වාගෙන යයි.

(4) ස්වදේශීය ආගම්වලට වරප්‍රසාද ලබාදෙයි.

(5) සමාජ ජීවිතයේ දී ස්වදේශීය සාරධර්ම දිරිමත් කරයි.

11. ගැටුම් කළමනාකරණය

(1) ගැටුම් සමථනයෙන් වෙන්කොට හඳුනා ගත නොහැකි ය.

(2) සිදු කළ හැක්කේ ගැටුමට සම්බන්ධ පාර්ශ්ව දෘඪ ස්ථාවරවල එල්බ සිටිය හොත් පමණි.

(3) සිදු කළ හැක්කේ ගැටුමට සම්බන්ධ පාර්ශ්වවල චර්යාව නොසලකා හැරිය හොත් ය.

(4) සිදු කළ හැක්කේ ප්‍රචණ්ඩ නොවන සන්නිවේදන මූලෝපාය අමතක කළ විට දී ය.

(5) සාර්ථක වන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශ්වවල පොදු අභිලාෂ හඳුනා ගත හොත් ය.

12. දේශපාලන පක්ෂ

(1) නියෝජිත ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ආයතනයකි.

(2) දීර්ඝ ඉතිහාසයක් සහිත ය.

(3) පළමුව සංවර්ධනය වූයේ ආසියාතික රටවල ය.

(4) බලපෑම් කණ්ඩායම්වලින් වෙන්කොට හඳුනාගත නොහැකි ය.

(5) ශ්‍රී ලංකාවේ දී පෙර නොවූ විරූ මහජන විශ්වාසයක් මෑත කාලයේ දී ලබාගෙන ඇත.

13. සිවිල් සමාජය

(1) සමාජයක කම්කරු පන්තියට වරප්‍රසාද සලසා දෙයි.

(2) රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයතනවලින් සමන්විත ය.

(3) රාජ්‍යය සහ වෙළෙඳපොළ අතරමැද පිහිටි ක්ෂේත්‍රයයි.

(4) ආණ්ඩු විසින් ප්‍රවර්ධනය කරනු ලැබේ.

(5) දේශපාලන පක්ෂවලට ආදේශකයක් වී ඇත.

14. ශ්‍රී ලංකාවේ සමකාලීන දේශපාලන පක්ෂ ක්‍රමය

(1) පක්ෂ ගණනාවකට ක්‍රියාත්මක වීමට ඉඩ ලබා දෙයි.

(2) ද්විපක්ෂ ක්‍රමයකි.

(3) අධිපති ඒක පක්ෂ ක්‍රමයකි.

(4) සභාග ආණ්ඩු අධෛර්යමත් කරයි.

(5) ඒක පක්ෂ ක්‍රමයකි.

15. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
(1) සංවර්ධනය වන ජාතීන්ට සංවර්ධන ආධාර සපයයි.
(2) සාමාජික රාජ්‍යයන් අතර වෙළෙඳාම නියාමනය කරයි.
(3) සාමාජික රාජ්‍යවල මූල්‍ය ස්ථාවරභාවයට පහසුකම් සපයයි.
(4) ජාතික ආර්ථිකය තුළ ශක්තිමත් රාජ්‍ය අංශයක් වෙනුවෙන් පෙනී සිටියි.
(5) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හස්තයයි. (......)

16. ශ්‍රී ලංකාවේ පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(1) රට නිරාගමික රාජ්‍යයක් බවට පත් කළේ ය.
(2) වෙස්ට්මින්ස්ටර් ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ රඳවා ගත්තේ ය.
(3) නෛතික ප්‍රතිකර්ම සහිත පරිපූර්ණ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ඇතුළත් කර ගත්තේ ය.
(4) ප්‍රබල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් සඳහා විධිවිධාන සැලසීය.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විප්ලවයක් සනිටුහන් කිරීමක් ලෙස සලකනු ලැබිණි. (......)

17. ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවට සිදු කළ 13 වන සංශෝධනයෙන්
(1) ජාතික ආරක්ෂාව හැර සෙසු බලතල විමධ්‍යගත කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.
(2) අවශේෂ බලතල පළාත් සභාවලට පවරාදීමට විධි විධාන සලසා ඇත.
(3) පළාත තුළ හදිසි අවස්ථාවක් ප්‍රකාශ කිරීමට ආණ්ඩුකාරවරයාට බලතල දෙන ප්‍රතිපාදන සලසා ඇත.
(4) පළාත් පාලන ආයතන සම්බන්ධ අධීක්ෂණ බලතල පළාත් සභාවලට පවරාදීමට විධිවිධාන සලසා ඇත.
(5) ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් ආණ්ඩුකාරවරයා පත් කිරීමට විධිවිධාන සලසා ඇත. (......

18. ප්‍රංශයේ පළාත් පාලන ක්‍රමය වඩාත් හොඳින් විස්තර වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙන් ද?
(1) එය උප-ජාතික මට්ටමේ ආණ්ඩු තල හතරකින් සමන්විත ය.
(2) එය පරිපූර්ණ බලය බෙදාහැරීමේ වැඩපිළිවෙලකට පරිණාමය වී ඇත.
(3) එය ප්‍රාදේශීය කටයුතු අලළා කොමියුනවලට සිය අභිමතය භාවිතයට ඉඩ දෙයි.
(4) එය පරිපාලන බලතල විමධ්‍යගතකරණය (විකේන්ද්‍රණය) සඳහා වන වැඩපිළිවෙලකි.
(5) එය සුළුතර වාර්ගික ජනකොටස් සඳහා බලය විමධ්‍යගත කිරීමට ගත් සාර්ථක උත්සාහයකි. (....

19. 'නීතියේ ආධිපත්‍යය' යේ හරය වන්නේ,
(1) පාලකයා සහ පාලිතයා නීතිය ඉදිරියේ එක හා සමාන ලෙස සැලකීම ය.
(2) හදිසි අවස්ථාවලදී සාමාන්‍ය නීති අභිබවා යාමට පාලකයාට ඉඩ සැලසීම ය.
(3) රාජ්‍යයේ නායකයාට නෛතික මුක්තිය ලබාදීම ය.
(4) පුද්ගලයින්ට විවිධ කුසලතා සහ හැකියා හිමි බව නීතිය ඉදිරියේ පිළිගැනීම ය.
(5) පාලකයින්ට ස්වකීය වූ අභිමතානුසාරී බලය මත ක්‍රියා කිරීමේ නිදහස ලබාදීම ය. (..

20. බහු ධ්‍රැව බලතුලනයෙන් අදහස් වන්නේ,
(1) ජාත්‍යන්තර පද්ධතිය කෙරෙහි ප්‍රමුඛ බලවතුන් දෙදෙනෙකු බලපෑම් කිරීම ය.
(2) ජාත්‍යන්තර පද්ධතිය කෙරෙහි බලපෑම් කරන ප්‍රමුඛ බලවතුන් කිහිපදෙනෙකු සිටීම ය.
(3) කලාපීය සහයෝගීතාව දුබල කිරීම ය.
(4) සුපිරි බලවතුන් අතර ඇතිවන ඉහළ මට්ටමේ සහයෝගීතාවය ය.
(5) අභිමත ආධිපත්‍යධාරී (හෙජමොනික) බලවතකු ජාත්‍යන්තර පද්ධතිය කෙරෙහි බලපෑම ය.

අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝර
අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

ස්ත්‍රීවාදී දේශපාලන න්‍යාය
A - සතුව රාජ්‍යය පිළිබඳ විශේෂ න්‍යායයක් නොමැත.
B - පුද්ගලික ද දේශපාලනික යැයි සලකයි.
C - පුරුෂ-කේන්ද්‍රීය බල ව්‍යුහ විවේචනය කරයි.
D - කාන්තාව මත ආධිපත්‍යය පවත්වා ගෙන යන එකම මෙවලම ලෙස රාජ්‍යය සලකයි.
E - පීතෘ මූලික සමාජ සම්බන්ධතා අහෝසි කිරීම අවධාරණය කරයි.
(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (...

'දේශපාලනය යනු රාජ්‍යය සම්බන්ධව හැදෑරීම' ලෙස සැලකීමෙන් අදහස් වන්නේ,
A - රාජ්‍යයේ ස්වභාවය හැදෑරීම ය.
B - රාජ්‍යය හා පුරවැසියන් අතර සම්බන්ධතාව හැදෑරීම ය.
C - ආණ්ඩුවේ ක්‍රියාවලිය හැදෑරීම ය.
D - ආණ්ඩුක්‍රම ආකෘති හැදෑරීම ය.
E - පුරවැසියන්ගේ ඡන්ද චර්යාව හැදෑරීම ය.
(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (...

රාජ්‍යය
A - සිවිල් සමාජයේ කැමැත්තට යටත් ය.
B - ඓතිහාසිකව විකාශනය වී ඇත.
C - සමාජය මත ආධිපත්‍යය පවත්වාගෙන යයි.
D - ස්පර්ශ කළ නොහැකි වුවත් යථාර්ථීය ප්‍රපංචයකි.
E - තම චිරසරභාවය සඳහා සුජාතභාවය මත රඳා පවතී.
(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (...

ජාතික රාජ්‍යය
A - නිශ්චිත භූමි ප්‍රදේශයකින් සමන්විත ය.
B - බලාත්කාරී බලය පිළිබඳ ඒකාධිකාරයට හිමිකම්පායි.
C - රාජ්‍ය නොවන ක්‍රියාධාරීන් විසින් පාලනය කරනු ලැබේ.
D - වෙස්ට්ෆේලියා සම්මුතිවලින් ජාත්‍යන්තර පිළිගැනීම හිමි කරගත්තේ ය.
E - බාහිර බලවතුන්ගේ නියෝගවලට අවනත වීමට ප්‍රතිරෝධය දක්වයි.
(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (...

ශුද්ධ ජනාධිපති මාදිලියේ ආණ්ඩු ක්‍රමය
A - බලතල වෙන්කිරීම මත පදනම් වේ.
B - විධායකයට සහ ව්‍යවස්ථාදායකයට වෙන් වෙන් වූ පැවැත්මකට ඉඩ දෙයි.
C - ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා හා විධායකයේ නායකයා බවට පත් කරයි.
D - ව්‍යවස්ථාදායකය ජනාධිපතිවරයාට යටහත් කරයි.
E - ජනාධිපතිවරයා තනතුරින් ඉවත් කිරීම දුෂ්කර කරයි.
(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E

● අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ජීවිතයට ඇති අයිතිය සඳහා පැහැදිලි ප්‍රතිපාදන සලසා ඇත. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය කෲර වධ හිංසාවලින් නිදහස් වීමට ඇති අයිතිය සහතික කරයි. | (……) |
| 27. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ඇතැම් පියවර ගෙන ඇත. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් මහාධිකරණයක් සඳහා විධිවිධාන සලසා ඇත. | (……) |
| 28. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන වගන්තියෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝණයකදී නෛතික ප්‍රතිකර්ම සඳහා වන කාර්ය පටිපාටිය දැක්වේ. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 19 වන සංශෝධනයෙන් ජාතික මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව දුබල කළේ ය. | (……) |
| 29. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ජනාධිපතිවරයා තනතුරින් ඉවත් කිරීම දුෂ්කර කරන ලදී. | 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයා දේශපාලන කාරණා මත තනතුරින් ඉවත් කිරීම වළකාලනු ලැබිය. | (……) |
| 30. | ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව සිංහල සහ දෙමළ භාෂා, ශ්‍රී ලංකාවේ ජාතික භාෂා බවට පත් කළේ ය. | ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට රාජ්‍ය සේවයේ පූර්ණ ස්වාධීනත්වය සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර ඇත. | (……) |

## B කොටස

**31.** 'දේශපාලනය' හැදෑරීම සඳහා අර්ථ කිහිපයක් තිබේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**32.** තුලනාත්මක දේශපාලනය අධ්‍යයනයේ ප්‍රධාන ධාරා තුනක් තිබේ. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**33.** ජෝන් ලොක් ආණ්ඩුවේ ප්‍රධාන වගකීම් තුනක් පිළිබඳ ව සඳහන් කළේ ය. ඉන් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**34.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**35.** සමාජ ව්‍යාපාරවලින් දේශපාලන පක්ෂ වෙන් කොට දක්වන සාධක **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**36.** පුරවැසිභාවය පිළිබඳ නූතන න්‍යාය ත්‍රිවිධාකාර පුරවැසිභාව හඳුනා ගෙන ඇත. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**37.** විද්‍යාත්මක සමාජවාදයේ පුරෝගාමී න්‍යායවේදීන් **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**38.** (1) සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භක ජර්මානු චින්තකයා නම් කරන්න.

..............................................................................................................

(2) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරිපත් කළ මුල්ම දේශපාලන පක්ෂය කුමක් ද?

..............................................................................................................

**39.** ෆැසිස්ට්වාදයේ ඕනෑම ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**40.** ස්ත්‍රීවාදී දේශපාලන සම්ප්‍රදාය **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

**41.** යටත් විජිත නිර්මාණය කිරීමේ ක්‍රම **දෙක** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**42.** (1) බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය තුළ ශ්‍රී ලංකාව 'ඩොමිනියන් තත්ත්වය' හිමිකර ගත්තේ කුමන වර්ෂයේ දී ද?

....................................................................................................

(2) ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ කුමන වර්ෂයේ දී ද?

....................................................................................................

**43.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව මතුකළ විවේචන **දෙකක්** ලියන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**44.** ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවට එරෙහිව මතුකළ විවේචන **දෙකක්** ලියන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**45.** ශ්‍රී ලංකාවේ, 1978 ආරම්භක ව්‍යවස්ථාව පාර්ලිමේන්තුව අභිබවා යන බලතල කිහිපයක් ජනාධිපතිවරයාට හිමිකර දුන්නේ ය. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**46.** දේශපාලන විද්‍යා විමර්ශනයේ ප්‍රධාන ආකාර දෙකක් පවතී. ඒවා නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**47.** නූතන දේශපාලන පක්ෂවල ඔනෑම කෘත්‍යයන් **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**48.** ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ත්‍රිවිධාකාර හදිසි අවස්ථා හඳුනා ගනී. ඉන් **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**49.** ශ්‍රී ලංකාව සාමාජිකත්වය ලබාගෙන ඇති අන්තර්ජාතික අන්තර්-රාජ්‍ය සංවිධාන **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**50.** සාර්ක් සංවිධානයේ සාමාජික රාජ්‍යයන් SAFTA සහ SAPTA යන සම්මුතිවලට එළැඹ තිබේ.

(1) SAFTA යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

....................................................................................................

(2) SAPTA යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

....................................................................................................

❊ ❊ ❊

30979

2023(2024)/23/S-II

[ සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved ]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

**දේශපාලන විද්‍යාව II**
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.
* **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය සහ විෂය ක්ෂේත්‍රය විස්තර කරන්න. (ලකුණු 20)

2. පාර්ලිමේන්තු සහ ජනාධිපති ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

3. (i) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය අර්ථකථනය කරන්න. (ලකුණු 05)
   (ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 15)

## II කොටස

4. (i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කරන ලද මූලික අයිතිවාසිකම් විස්තර කරන්න. (ලකුණු 10)
   (ii) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරබයා අධිකරණයේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. " ශ්‍රී ලංකාවෙහි යටත් විජිත රාජ්‍යය ඇතැම් අනපේක්ෂිත සාධනීය ප්‍රතිඵල ඇති කර තිබේ." ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 20)

6. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 20)

7. (i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔම්බුඩ්ස්මන්වරයා (පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා) සතු බලතල සහ කාර්යයන් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 05)
   (ii) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර ඇති සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 15)

[දෙවැනි පිටුව බලන්න.

## III කොටස

8. (i) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සහ කැන්ටන අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ-සන්ධීය යැයි පවසන්නේ ඇයි ? (ලකුණු 10)

9. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය වීමට බලපාන ප්‍රධාන නිර්ණායක පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 20)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ගැටුම් නිරාකරණය
(ii) නීතියේ ආධිපත්‍යය
(iii) ශ්‍රී ලංකාව හා සාර්ක් (SAARC) සංවිධානය
(iv) මිශ්‍ර ආණ්ඩුක්‍රම ආකෘතිය
(v) ජනවාර්ගික දේශපාලන පක්ෂ
(vi) ප්‍රතිපත්ති චක්‍රය (ලකුණු 10 × 2 = 20)

* * *